## 2019 මැයි මාසය සඳහා අයැදීමට සහ
## මැදිහත් වීමට අත්වැලක්
## "ස්වාමිනී අප සමඟ නතර වුව මැනව" (ශු.ලූක් 24:29)

පසුගිය පාස්කු ඉරුදින ඇතිවූ බිහිසුනු බේදවාචකයෙන් අපගේ කිතුනු සහෝදර සහෝදරියන් මෙන්ම විදේශීය සංචාරකයින් බොහෝ දෙනෙක් මරණයට පත් වූ අතර දැනටමත් බොහෝ දෙනෙක් තුවාල ලබා රෝහල්වල ප්‍රතිකාර ලබන බව ඔබ දන්නා කරුණකි. එමෙන්ම තවමත් මේ ත්‍රස්තවාදීන් අප රට තුළ සැඟවී තවත් බොහෝ විනාශයන් කිරීමට මාන බලමින් සිටී.

කිතුනු ජනතාවත්, පුබුදු ජනතාවත් මෙන්ම අයැදීමේ සහ මැදිහත්වීමේ සේවකයන් වශයෙන් ඔබත් මමත් මීට වඩා වුවමනාවෙන් සහ කැපවීමෙන් ශුද්ධාත්මයාණන්ට අවදිවී මනස්ස්ථාපනයෙන් යුක්තව අප දේශය වෙනුවෙන් නිරන්තරයෙන් යාච්ඤා කිරීමට පියවර ගනිමු. එමෙන්ම මේ කාල පරාසය තුළ අපගේ ශුද්ධාත්ම මහා මංගල්‍යයට සූදානම් වීම සඳහා අඛණ්ඩ යැදුම් ආරම්භ වී ඇත. වගකිව යුත්තන් දැනුම් දෙන තුරු දැනට පැය 24 පුරාම අදාළ ශ්‍රාවක සංඝවල, නිවෙස්වල සිට පෞද්ගලිකව යාච්ඤා කිරීමට උපදෙස් ලැබී ඇත.

අයැදීමේ සේවකයන් වශයෙන් ඔබත් / මමත් නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන්ට අවදි වී අපගේ මැදිහත් යැදුම උපවාසයෙන් සහ මර්ධන ක්‍රියාවලින් යුක්තව 'අබ්බා තාත්තා - අබ්බා අම්මා' වෙත යොමු කර සිටිමු.

> **"මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙක සලසන්නෙමි."** (2වංශාවලිය 7:14)

| දිනපතා කියවන්න - ගීතාවලිය 140, 142, 143, 144, 146, 116, 91 |
|---|

පළමු සතිය : දිව්‍යමට කියවීම - ශු.ලූක් 24:28-35
අයැදීමට විශේෂ යෙමුව :

ත්‍රස්ත ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත් වූ ආත්ම වෙනුවෙන් සහ දැනටමත් තුවාල ලබා ප්‍රතිකාර ලබන සියළු දෙනා වෙනුවෙන් ද, මිය ගිය අයගේ නෑදෑ හිතවතුන් සහ ශෝකයට පත් වී සිටින සියළු දෙනා වෙනුවෙන් සහ දැනටමත් සැඟවී සිටින ත්‍රස්තවාදීන්ව නීතියේ රැහැනට හසුකර ගන්නා පිණිසත්, ඒ සඳහා ක්‍රියාන්විත වන රජයේ බලධාරීන්, පොලිසිය, ත්‍රිවිධ හමුදාවේ සියල්ලන් වෙනුවෙන්.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* කාදිනල් තුමන් ඇතුළු සියළුම පූජකයන්ට කිතුනු ජනතාව වෙනුවෙන් නිවැරදි තීරණ ගැනීමට අවැසි ශුද්ධාත්ම ආලෝකය ලැබෙන පිණිස.
* ස්වාමි තාත්තා වෙනුවෙන් සහ එතුමන් රට වෙනුවෙන් දියත් කළ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමට දොරටු විවෘත වන පිණිස.
* දිවැසි එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනාටම දේශය වෙනුවෙන් සහ ශුද්ධාත්ම මංගල්‍යය මුල් කරගෙන නිවැරදි තීරණ ගැනීමට ප්‍රඥාව ලැබෙන පිණිස.
* වෙනත් අයැදීම් .....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - 1කොරෙන්ති 15:51-58
අයැදීමට විශේෂ යොමුව :

අප රට තුළ මෙන්ම විවිධ රටවල පවතින ත්‍රස්තවාදයන් මුලිනුපුටා දැමෙන ලෙස.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ශුද්ධෝත්තම පියාණන් වෙනුවෙන්.
* අඛණ්ඩ යාච්ඤාවේ යෙදෙන සියල්ලන් වෙනුවෙන්.
* ත්‍රස්ත ප්‍රහාරයන් මැඩලීමට ක්‍රියා කරන ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සියළු දෙනා වෙනුවෙන්.
* ජනාධිපති හා පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරු වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

තෙවන සතිය: දිව්‍යමය කියවීම - 1කොරෙන්ති 15:29
අයැදීමට විශේෂ යොමුව :

මත් පැන්, මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කරන ජාවාරම් කරුවන් සහ වස විෂ ශරීරයට අහිතකර රසකාරක නිපදවන ජාවාරම් කරුවන්ගෙන් සහ බහුජාතික සමාගම් මෙන්ම පාතාල කල්ලි අප රටෙන් තුරන් වන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* මත් පැන්, මත් ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් වෙනුවෙන්.
* වකුගඩු රෝග, පිලිකා ඇතුළු සුව නොවන රෝගයන්ගෙන් පෙළෙන අය වෙනුවෙන්.
* අඛණ්ඩ යැදුමේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්.
* පාසල් දරුවන් සහ ගුරුවර - ගුරුවරියන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

සතරවන සතිය: දිව්‍යමය කියවීම - ශු.ජුවාම් 14:15-20
අයැදීමට විශේෂ යොමුව :
දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)
වෙනත් අයැදීම් .....

අබ්බා තාත්තේ - අබ්බා අම්මේ, දුර්වල පාපිෂ්ඨ අප ගැන ඔබ වහන්සේ අනුකම්පා කළ මැනව. අපගේ පාපයන් සහ අධර්මිෂ්ඨකම් නිසා අපවම විනාශ වනවාත් මෙන්ම අපගේ පවුල් දරුවන් මෙන්ම, අපගේ රට වැසියන් විනාශය කරා යන බව අපි දනිමු. අබ්බා පියාණෙනි, ඔබගේ ආත්මයන් වහන්සේගේ බලයෙන් අපගේ පාපයන් අපට පෙන්වා දෙමින් මනස්ස්ථාපනය වී අපගේ ජීවිත නවතාවයකට පත්කර ගැනීමට අපට උදව් වුව මැනව.

**"දැන් ඔබ ශෝක වන්නහුය.**
**එහෙත් නැවත මම ඔබ දකින්නෙමි.**
**එවිට ඔබේ සිත් ප්‍රීතියෙන් පිනා යයි.**
**ඔබේ ප්‍රීතිය ද කිසිවෙක් ඔබෙන් පැහැර නොගනිති. "**

(ශු.ජුවාම් 16:22)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************